

# එන්න, මා අනුගමනය කරන්න —

## වැඩිහිටි සනපූර්ණය සහ සහන සමිතිය සඳහා

*මෙම ලිපි ''ගොස්පල් ලයිබ්‍රරි''යන ඇප් එක තුලින්ද සොයාගත හැකිය comefollowme.lds.org.*



# අපිට වැඩිහිටි ඝනපූර්ණ සහ සහන සමිති රැස්වීම්

## ඇත්තේ ඇයි?

මෙම පසු-දවස් වලදී, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ගැලවීමේ කාර්යය ඉටුකරගැනීමට පූජකවරය නැවත පිහිටුවා සහ පූජකවර ඝනපූර්ණය සහ සහන සමිතිය සංවිධානය කල සේක. මේ හේතුවෙන්, එක් එක් ඉරුදින අපි වැඩිහිටි ඝනපූර්ණයේ සහ සහන සමිතියේ රැස්වී රැස්වීම් පවත්වමු, දෙවියන්වහන්සේගේ කාර්යය ඉටුකිරීම සඳහා උදව් කිරීමට අපි කුමක් කල යුතු දැයි අපි සාකච්ඡා කර සැලසුම් කරන්නෙමු. එය ඵලදායී වන්නට නම්, මෙම රැස්වීම් පන්තියකට වඩා වැඩි දෙයක් විය යුතුය. ඒවා ගැලවීමේ කාර්යය පිලිබඳ උපදෙස් බෙදාගැනීමට, සභා නායකයන් මගින් එම කාර්යය පිලිබඳ එකතුවී ඉගෙනගැනීමට සහ ඒවා සාර්ථක කරගැනීමට අපවම සංවිධානය කරගැනීමට අවස්ථාවන්ය.

# පළමු ඉරුදින

## සභා රැස්වීම්

සෑම මසකම පළමු ඉරුදින, වැඩිහිටි ඝනපූර්ණය සහ සහන සමිතිය රැස්වීමක් පවත්වයි එයට  ගුරුවරයෙකු විසින් උගන්වන පාඩමක් අන්තර්ගත නොවිය යුතුයි., ඒ වෙනුවට, වැඩිහිටි ඝනපූර්ණ සහ සහන සමිති සභාපතීත්ව සභා රැස්වීම් මෙහෙයවනු ලබයි. මෙම පළමු ඉරුදින සභා රැස්වීම වලදී, එක් එක් වැඩිහිටි ඝනපූර්ණය සහ සහන සමිතිය, ප්‍රාදේශීය වගකීම්, අවස්ථා, සහ අභියෝග ගැන එක්ව උපදෙස් බෙදාගනී, එකිනෙකාගේ අදහස් හා අත්දැකීම් තුලින් ඉගෙනගනී; සහ ශුද්ධාත්මයාණන්ගෙන් ලැබූ අනුභාවය මත ක්‍රියා කිරිමට සැලසුම් කරයි. මෙම සාකච්ඡා අදාළ ශුද්ධලියවිලි හා ජීවත්වන අනාගතවක්තෘවරුන්ගේ ඉගැන්වීම් මත  රඳා පැවතිය යුතුයි.

සෑම සභා රස්විමක්ම එක සමාන  නොවනු ඇත. සාර්ථක සභා රැස්වීමක් මෙහෙයවීම සඳහා සභාපතිත්වයට උපකාරී වන යම් උපදෙස් කිහිපයක් මෙන්න.



# පළමු ඉරුදින සහා රැස්වීම් සඳහා මාතෘකා

සහා රැස්වීම් සාකච්ඡා සඳහා අදහස් සමහර විටදී සහාපතිත්ව රැස්වීම් තුලින් ඒවි, කොට්ඨාශ සහා රැස්වීම්, ප්‍රාදේශීය සැලසුම, සාමාජිකයන්ට දේව සේවය කිරීමේදී නායකයන් ලබන පෙළඹවීම්, සහ ශුද්ධාත්මයාණන්ගේ පෙළඹවීම් තුලින් ලැබෙන්නට පුළුවන්. පහත සඳහන් මාතෘකා යෝජනාවන් පමණි. ඔවුන් ආමන්ත්‍රණය කල යුතු යැයි දැනෙන අනෙකුත් අවශ්‍යතා පිලිබඳ නායකයන් යම් විටක දැනුවත් වන්නට පුළුවන්.

- අප වටා සිටින අයට දේව සේවයක් ලබාදීම සඳහා අප කුමක් කල යුතුද? (මොසායා 23:18 බලන්න).
- අපේ එකිනෙකට වෙනස් වූ වගකීම් වලට ප්‍රමුකතාවය ලබාදෙන්නේ කොහොමද?
- අපගේ මිතුරන් හා අසල්වාසීන් සමග අපි ශුභාරංචිය පිලිබඳ බෙදාගන්නේ කොහොමද? (ඇල්මා 17 බලන්න).
- නුසුදුසු මාධ්‍යයෙන් සහ අසභ්‍ය දර්ශන වලින් අපිවත් අපේ පවුලුත් ආරක්ෂා කරන්නේ කොහොමද?
- අපේ දරුවන්ට සහ කොට්ඨාශයේ තරුණයන්ට උපදෙස් ලබාදීමට සහ ඔවුන්ව ශක්තිමත් කරන්නට අපි කුමක් කල යුතුද?
- පවුල් ඉතිහාස සහ දේවමාලිගා කාර්යයන් වලට අපි තව තවත් යොමු වන්නේ කොහොමද?
- අපි අපේ ශුභාරංචි ප්‍රශ්ණ වලට පිළිතුරු සොයද්දී සහ ශුභාරංචිය පිලිබඳ ගැඹුරු තේරුම්ගැනීමක් ලුහුබඳිද්දී ස්වාමින්වහන්සේගේ උපකාරය සඳහා අපි අරාධනා කරන්නේ කෙසේද?
- ස්වාමින්වහන්සේ කෙරෙහි සහ උන්වහන්සේගේ ශුභාරංචිය කෙරෙහි අපේ සාක්ෂිය ශක්තිමත් කිරීමට සහ ආත්මිකව අපේ පවුල් වලට ඔවුන් මතම යැපෙන්නට උදව් වෙන්නේ කොහොමද?

## සහා රැස්වීමට පෙර

**කරන්න:**

- ප්‍රාදේශීය අවශ්‍යතා, අවස්ථා සහ අභියෝග හඳුනාගන්න.
- යාච්ඤාශීලීව සාකච්ඡා කිරීමට මාතෘකාවක් තෝරාගන්න.
- සනපූර්ණ සාමාජිකයන්ට හෝ සහන සමිති සහෝදරියන්ට අදහස් සහ අත්දැකීම් බෙදාගැනීමට සූදානම්ව පැමිණෙන ලෙස ආරාධනා කරන්න.

**නොකරන්න:**

- පාඩමක් සූදානම් කිරීම.
- නිශ්චිත විසඳුමක් හෝ ක්‍රියා සැලසුමක් හිතේ ඇතිව පැමිණීම.

## සහා රැස්වීම අතරතුර

**කරන්න:**

- පසුගිය රැස්වීම් වල සංකල්පනා සහ සැලසුම් මත **ඔවුන්ගේ අත්දැකීම් බෙදාගැනීමට** සාමාජිකයන්ට ආරාධනා කරන්න.
- රැස්වීම් මාතෘකාව හඳුන්වාදී **සභාව එක්ව** ශුද්ධලියවිලි, අනාගතවක්තෘවරුන්ගේ වචන සහ ශුද්ධාත්මයාණන්ගේ මගපෙන්වීම යටතේ විසඳුම් සහ මගපෙන්වීම සොයමින්, ඒ පිලිබඳ උපදෙස් බෙදාගන්නා ලෙස සාමාජිකයන්ව උනන්දු කරවන්න.
- සාකච්ඡාව මත **ක්‍රියා කරන ආකාරය සැලසුම් කරන්න**. මෙය කණ්ඩායම් තීරණ හෝ එක් එක්කෙනා තමන් විසින් සාදාගන්නා තීරණ විය හැකිය.

**නොකරන්න:**

- සාකච්ඡාවේ ආධිපත්‍ය ලබාගැනීම.
- ඔබගේ අදහසට අනෙක් අයව කැමති කරවාගන්නට උත්සහ කිරීම.
- සංවේදී හෝ රහසිගත කරුණු පිලිබඳ සාකච්ඡා කිරීම.
- පාඩමක් ඉගැන්වීම.
- යම් කෙනෙකුට සහභාගී වන ලෙස බලකිරීම.

## සහා රැස්වීමෙන් පසු

**කරන්න:**

- සහා රැස්වීම අතරතුරදී කරන ලද සැලසුම් සහ පැවරුම් පිලිබඳ පසු විපරමක් කරන්න.
- කැඳවීමක් හෝ වෙනත් හේතුවක් නිසා රැස්වීමට සහභාගී වන්නට නොහැකි වූ අය ඇතුලත් කරගැනීම සඳහා මාර්ග සොයාගන්න. සැලසුම් කල දේ ගැන ඔවුන්ව දැනුවත් කරන්න.
- අනාගත රැස්වීම වලදී අත්දැකීම් බෙදාගන්නට සාමාජිකයන්ට අවස්ථා ලබා දෙන්න.

*"මෙම සහා රැස්වීමේ සුන්දරම දේවල් වලින් එකක් නම්, රැස්වීම අවසානයේදී ඔබ ක්‍රියා සැලසුමක් ඇතිකර ගැනීමයි."*

-ජීන් බී. බින්ග්හම් සහෝදරිය, සහන සමිති ප්‍රධාන සභාපතිනිය

# දෙවැනි සහ තුන්වෙනි ඉරුදින

## රැස්වීම්

සෑම මසකම දෙවන සහ තුන්වන ඉරුදින, වැඩිහිටි සනපූර්ණය සහ සහන සමිතිය ප්‍රධාන සම්මන්ත්‍රණයේ සභා නායකයන්ගේ මෑතකාලීන ඉගැන්වීම් තුලින් ඉගෙන ගනී. පළමු සභාපතිත්වයේ සාමාජිකයන්ගේ සහ දොළොස්දෙනාගේ සනපූර්ණයේ ප්‍රේරිතවරුන්ගේ පණිවිඩ වලට අවධානය යොමු කල යුතුය. ඒ කොහොමවුනත්, ආත්මයාණන්ගේ මගපෙන්වීමට අනුව ප්‍රාදේශීය අවශ්‍යතා මත පදනම්ව, මෑතකාලීන සම්මන්ත්‍රණ පණිවිඩ වලින් ඕනෑම එකක් සාකච්ඡාවට ගත හැකියි.

බොහෝ අවස්ථා වලදී, වැඩිහිටි සනපූර්ණ සහ සහන සමිති සභාපතිත්ව සාමාජිකයන්ගේ අවශ්‍යතා වලට අනුකූලව සම්මන්ත්‍රණ පණිවිඩයක් තෝරාගනීවි, එහෙත් සභානායකවරයා හෝ ස්ටේක සභාපති විසින් අනුදැනුම් ලබාදෙනු ඇත. නොබෝදා සිදුවූ පළමු ඉරුදින සභා රැස්වීමට ආදාලව නායකයන් විසින් පණිවිඩ මාතෘකාවක් තෝරාගනු ලබයි, හෝ ශුද්ධාත්මයාණන්ගේ මගපෙන්වීම යටතේ වෙනත් මාතෘකාවක් වුවද ඔවුන් තෝරාගනු ලබයි.

තෝරාගත් පණිවිඩය කලින්ම කියවා සහ ඒවා මත ක්‍රියා කරන ආකාරය සහ ශුභාරංචි සත්‍ය පිලිබඳ අදහස් සමග සූදානම් වී පැමිණෙන ලෙස සාමාජිකයන්ව දිරිමත් කිරීමේ ආකාර නායකයන් සහ ගුරුවරුන් විසින් සොයාගත යුතුයි. ගැලවුම්කරුවාණන්ගේ උගන්වන ආකාරයේ මූලධර්ම මත පදනම්ව සපයා ඇති පහත යෝජනා කර ඇති ක්‍රියාකාරකම්, ප්‍රධාන සම්මන්ත්‍රණ පණිවිඩ ඉගෙනගැනීමට සාමාජිකයන්ට උපකාරී වනු ඇත.

> *"ඔබගේ පවුල් සැන්දෑ වල, ඔබේ ශුභාරංචි ඉගැන්වීම් වල, [සහ] ඔබේ පවුලේ සහ යහළුවන් අතර කතාබහ තුල, ප්‍රධාන සම්මන්ත්‍රණ පණිවිඩ ඇතුලත් කල හැකි ආකාර හෘදසාක්ෂියට එකඟවම සොයන්න."*
>
> සභාපති රසල් එම්. නෙල්සන්, "අපි එක්ව ඉදිරියට යමු," *ලියහෝනා*, මැයි 2018, 118.

**එම්. රසල් බැලර්ඩ්,** *"Precious Gifts from God," 9-11*

සභාපති බැලර්ඩ්ගේ පණිවිඩය මාතෘකා ගණනාවක් ආමන්ත්‍රනය කරයි - අනාගතවක්තෘවරුන්, ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහිල්ල, සක්‍රමේන්තුව, සහ සේවය පිලිබඳ - අර්ථාන්විත සහ වැදගත් වන වෙනස් වූ මාතෘකා සනපූර්ණ සහ සහන සමිති සාමාජිකයන් විසින් සොයාගනු ලබයි. මෙම පණිවිඩයෙන් ඔවුන්ගේ සිත් තුලට කා වැදුණු යම් දෙයක් බෙදාගන්නට සාමාජිකයන්ට ආරාධනා කරන්න. සභාපති බැලර්ඩ්ගේ පණිවිඩයෙන් අපි සොයාගන්නා ආරාධනාවන් සහ පොරොන්දු වූ ආශිර්වාද මොනවාද? මෙම සාකච්ඡාවේ ප්‍රතිපලයක් ලෙස සාමාජිකයන්ට ආරාධනා කර ඔවුන්ට කල යුතුයි යැයි හැඟෙන දේ ගැන මෙනෙහි කරන්නට විනාඩි කීපයක් ලබාදෙන්න.

**ගැරී ඊ. ස්ටීවන්සන්,** *"The Heart of a Prophet," 17-20*

නව අනාගතවක්තෘවරයෙකුගේ කැඳවීමේ "සුවිශාලත්වය තේරුම් ගැනීමට" සාමාජිකයන්ට උපකාර කිරීම පිණිස, වැඩිහිටි ස්ටීවන්සන්ගේ පණිවිඩය පරික්ෂා කර බැලීමට සාමාජිකයන්ට ආරාධනා කරන්නට ඔබට පුළුවන්, ඒ තුලින් එම දිව්‍යමය ක්‍රියාවලියේ දැවැන්ත බව සහ ශුද්ධවන්ත බව තේරුම්ගැනීමට උදව් වන සත්‍යන් සහ පෙළඹවීම් දකින්නට ඔවුන්ට පුළුවන්. සභාපති නෙල්සන්ව සභාවේ සභාපති ලෙස පත් කරන ලද ඒ උදාර රැස්වීමේදී ඔවුන්ට දැනුනු දේ බෙදාගැනීමට සාමාජිකයන්ට ආරාධනා කිරීම ගැන සලකා බලන්න. ලිවීමට ඇති පුවරුවේ හදවත් හැඩයක් ඇඳ, සභාපති නෙල්සන්ගේ ආකාරය ගැන විස්තර කරන වචන හෝ වාක්‍ය ඒ මත ලියන්නට සාමාජිකයන්ට ආරාධනා කරන්නට තවත් ඔබට පුළුවන්. ඔහු අපට ඉගැන්වූ කුමක් අපට ආශිර්වාද කර ඇත්ද?

**නීල් එල්. ඇන්ඩර්සන්,** *"The Prophet of God," 24-27*

වැඩිහිටි ඇන්ඩර්සන්ගේ පණිවිඩය ජීවමාන අනාගතවක්තෘවරුන් පිලිබඳ සාමාජිකයන්ගේ ඇදහිල්ල ශක්තිමත් කරන ආකාරය ගැන සාකච්ඡා කරන්න. දෙවියන්වහන්සේට මේ පොළව මත අනාගතවක්තෘවරුන් සිටින්නේ ඇයි සහ අපි ඔවුන්ව අනුගමනය කරන්නේ ඇයි යන කාරණා ඔවුන්ට තේරුම්ගැනීමට උපකාර වන පිණිස ඔහුගේ පණිවිඩය ගැන සොයාබලන්නට ඔවුන්ට ආරාධනා කරන්නට ඔබට පුළුවන්. අපට අනාගතවක්තෘවරයෙක් සිටින නිසා අපි ආශිර්වාද ලබා ඇත්තේ කොහොමද? සභාපති රසල් එම්. නෙල්සන් ස්වාමින්වහන්සේගේ අනාගතවක්තෘවරයෙකු බවත් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පසු-දවස්වල නූතන සාන්තුවරයන්ගෙන් යුත් සභාවේ සභාපති ලෙසත් ඔවුන් සාක්ෂියක් ලබාගත් ආකාරය සාමාජිකයන්ට බෙදාගත හැකිය.

**ඩේවිඩ් ඒ. බෙඩ්නාර්,** *"Meek and Lowly of Heart," 30-33*

වැඩිහිටි බෙඩ්නාර්ගේ පණිවිඩය පිලිබඳ සාකච්ඡා කිරීමට දිරිගැන්වීමක් වශයෙන් නිහතමානීකම යනු... සහ නිහතමානීකමක් නොවන්නේ... , ලෙස ඔබට සටහන් පුවරුවේ ලියන්නට පුළුවන්, ඉන්පසු වැඩිහිටි බෙඩ්නාර්ගේ පණිවිඩය කියවා බලා මෙම ප්‍රකාශ සම්පූර්ණ කිරීමට අවශ්‍ය වාක්‍ය බෝඩ් එක මත සටහන් කරන්නට සාමාජිකයන්ට පුළුවන්. අපට නිහතමානී වන්නට පොළඹවන කුමන පණිවිඩ අපි මේ තුලින් ඉගෙනගත්තාද? අපට සිතිය හැකි

නිහතමානීකමේ උදාහරණ මොනවාද? වඩා වඩාත් නිහතමානී වන්නට වැඩිහිටි බෙඩ්නාර්ගේ උපදෙස් අපි යොදාගන්නේ කොහොමද?

**බොනී එල්. ඔස්කාර්සන්,** *"Young Women in the Work," 36-38*

ප්‍රශ්ණ යනු මෙනෙහි කිරීමට අරාධනා කරන ඒක අකාරයක්. ස්වාමින්වහන්සේගේ කාර්යයේ තරුණ කාන්තාවන්ව සම්බන්ධ කරගත හැක්කේ කෙසේද යන්න? වැනි, ඔස්කාර්සන් සහෝදරියගේ පණිවිඩය පිළිතුරු ලබාදෙන ප්‍රශ්ණ කිහිපයක් පුවරුව මත ලිවීම ගැන සලකා බලන්න, ඇයගේ පණිවිඩය පිරික්සා මෙම ප්‍රශ්ණ වලට පිළිතුරු සොයමින් ඔවුන් ඉගෙනගත් දේ ගැන සාකච්ඡා කරන්නට සාමාජිකයන්ට ආරාධනා කරන්න. දේව සේවයට තරුණ කාන්තාවන් සම්බන්ධවීමෙන් පැමිණෙන ආශිර්වාද මොනවාද? තවදුරටත් තරුණ කාන්තාවන් සමග දේව සේවය කිරීම පිලිබඳ පන්තියේ සාමාජිකයන්ට අත්දැකීම් බෙදාගන්නට පුළුවන්. අපේ සාකච්ඡාව මත පදනම්ව, ඔබට කරන්නට හැඟුනේ මොනවාද?

**ඩාලේ ජී. රෙන්ලන්ඩ්,** *"Family History and Temple Work: Sealing and Healing," 46-49*

දේවමාලිගාව හා එයින් වතුර වේගයෙන් පිටතට යාම ගැන එසකියෙල්ගේ දර්ශනය ගැන වැඩිහිටි රෙන්ලන්ඩ් කතා කළේය (එසකියෙල් 47:8-9). තවදුරටත් සනපූර්ණයේ හෝ සහන සමිතියේ සාමාජිකයෙක්ට එම දර්ශනයේ චිත්‍රයක් පුවරුවේ අඳින්නට පුළුවන්. දේවමාලිගා සහ පවුල් ඉතිහාස කාර්යය එසකියෙල්ගේ දර්ශනයේ ජලය මෙන් ක්‍රියා කරන්නේ කොහොමද? ඔවුන් අත්දැක ඇති දේවමාලිගා සහ පවුල් ඉතිහාස කාර්යයන් තුල ලැබූ අත්දැකීම් තුලින් ලද ආශිර්වාද බෙදාගන්නට පන්තියේ සාමාජිකයන්ට ආරාධනා කරන්නට ඔබට පුළුවන්. දේවමාලිගා සහ පවුල් ඉතිහාස කාර්යය අපේ ජිවිතයේ එදිනෙදා අංගයක් කරගැනීමට අපට කල හැක්කේ කුමක්ද?

**ඩී. ටොඩ් ක්‍රිස්ටෝෆර්සන්,** *"The Elders Quorum," 55-58*

වැඩිහිටි සනපූර්ණය තුල, "මෙම වෙනස්කම් වල අරමුණ" යන මාතෘකාව යටතේ වූ වැඩිහිටි ක්‍රිස්ටෝෆර්සන්ගේ පණිවිඩයේ කොටස කියවන්නට සනපූර්ණයේ සාමාජිකයන්ට ආරාධනා කරන්නට ඔබට පුළුවන්. මෙම අරමුණු ඉටුකර ගැනීම සහතික කරගැනීමට අපට කල හැක්කේ කුමක්ද? සහන සමිතිය තුල, වැඩිහිටි ක්‍රිස්ටෝෆර්සන් පැහැදිලි කල මෙල්කිසදෙක් පූජකවර සනපූර්ණ වල වෙනස්කම් ගැන සාරාංශ කරන්නට කෙනෙකුට ආරාධනා කරන්නට ඔබට පුළුවන්. ඉන්පසු සහන සමිතියේ ක්‍රියාකාරකම් වලට යොදාගත හැකි වෙනස්කම් ඇඟවෙන මූලධර්ම හඳුනාගන්නට සහෝදරියන්ට පුළුවන්. සහෝදර ගෝටාස්ගේ කතාවෙන් ඉගෙනගෙන ඔවුන්ගේ කාර්යයන්ට එය අදාළ කරගත හැකි ආකාරය, වැඩිහිටි සනපූර්ණයේ හෝ සහන සමිතියේ සාමාජිකයන්ට සාකච්ඡා කරන්නට පුළුවන්.

**රොනල්ඩ් ඒ. රස්බෑන්ඩ්,** *"Behold! A Royal Army," 58-61*

තවදුරටත් "Behold! A Royal Army" (ගීතිකා අංක. 251) ගායනා කිරීමෙන් හෝ සවන් දීමෙන් හෝ එහි වචන කියවීමෙන් වැඩිහිටි රස්බෑන්ඩ්ගේ පණිවිඩය ගැන එක්ව සාකච්ඡා කල හැකියි. පූජකවර සනපූර්ණය සහ සහන සමිතිය රාජකීය සේනාවක් මෙන් වන්නේ කොහොමද? වැඩිහිටි සනපූර්ණ නැවත ප්‍රතිසංවිධානය කිරීම තුලින් පැමිණෙන "ඉතා විශාල ආශිර්වාද සමූහය" පිලිබඳ වැඩිහිටි රස්බෑන්ඩ් පවසන ලද දේ දෙස බලමින් ඒවා ගැන සාමාජිකයන්ට සාකච්ඡා කල හැකියි. මේවා ක්‍රියාත්මක වීමෙන් අපට ලැබී ඇති - අපට ලැබෙන්නට බලාපොරොත්තු වන - අනෙකුත් ආශිර්වාද මොනවාද? "විවිධ ත්‍යාග" සහ "උපදේශ" යන ආශිර්වාද සහන සමිතින් සම්පූර්ණයෙන්ම ලබා කරගන්නේ කෙසේද?

**හෙන්රි බී. අයරින්,** *"Inspired Ministering," 61-64*

ඔහුගේ සිතට කා වැදුණු සක්‍රමේන්තු රැස්වීම් කතාවන් දෙකක් ගැන සභාපති අයරින් පැවසුවා. සමහරවිට ඔබට පුළුවන් සනපූර්ණ සහ සහන සමිති සාමාජිකයන්ගෙන් භාගයකට වයස අවුරුදු 14 පිරිමි ළමයා ගැන වචන නැවත බලන්නටත් අනෙක් භාගයට නිවාස ගුරුවරයාගේ කතාව නැවත බලන්නටත් කියන්නට ඔබට පුළුවන්. ඔවුන් කියවන අතරතුර, යම් කෙනෙකුට දේව සේවය සපයන්නට අලුතින් පැවරුමක් ලද තරුණ පිරිමි ළමයෙකු හෝ ගැහැණු ළමයෙකු ට දිය හැකි අවවාදයක් ගැන සාමාජිකයන්ට සිතන්නට පුළුවන්. "අපගේ දේව සේවයේදී… අපි වඩාත් ප්‍රබෝධමත් සහ ප්‍රේමනීය බවට පත්වන්නේ" කොහොමද?

**ඩාලින් එච්. ඕක්ස්,** *"The Powers of the Priesthood," 65-68*

සාකච්ඡාව ආරම්භ කිරීමට, සභාපති ඕක්ස්ගේ පණිවිඩයේ කාණ්ඩ හතරේ මාතෘකා බෝඩ් එකේ සටහන් කරන්නට ඔබට පුළුවන්. ඉන්පසු එක් එක් කාණ්ඩයක් නිහඬව කියවා එහි සාරාංශයක් වන ඒක වාක්‍යක් බෝඩ් එකේ ලියන්නට එක් එක් සාමාජිකයාට ආරාධනා කරන්න. ඔවුන් කියවූ දේ නිසා කරන්නට පෙළඹුණු දේ ගැන ඉන්පසු සාමාජිකයන්ට බෙදාගන්නට පුළුවන්. සභාපති ඕක්ස්ගේ පණිවිඩයේ ඉගැන්වීම් අපට ආදාගන්නා අතරම පූජකවරය දරන්නන් සහ සහන සමිති



සහෝදරියන් ලෙස අපේ සේවය වැඩි දියුණු කරගන්නේ කොහමද?

**රසල් එම්. නෙල්සන්,** *"Ministering with the Power and Authority of God," 68-75*

"නැගිට සිටින්නට" සහ ස්වර්ගීය පියාණන්ගේ දරුවන්ට ආශිර්වාද කිරීම සඳහා පූජකවරය භාවිතා කරන්නට සභාපති නෙල්සන් පූජකවරය දරන්නන්ට ආරාධනා කරයි. ඔහු ලබාදුන් උදාහරණ පරීක්ෂා කර බලන්නට සහ ඔවුන්ගේ පවුල් සහ අන් අය ආශිර්වාද කරන්නට පූජකවරය භාවිතා කරන අයුරු තේරුම් ගැනීමට ඒවා ඔවුන්ට උදව් වන්නේ කෙසේද යන්න සාකච්ඡා කරන්නට සනපූර්ණයේ සහ සහන සමිති සාමාජිකයන්ට ආරාධනා කරන්න. පූජකවර බලයෙන් අපි ආශිර්වාද ලැබූ විට අපට බෙදාගත හැකි අත්දැකීම් මොනවාද? "උන්වහන්සේගේ නාමයෙන් දේව සේවය කරන්නට" දෙවියන්වහන්සේගේ පූජකවරය භාවිතා කරන්නට අපටත් අන් අයටත් ඇඳහිල්ල ලබාගන්නට අපි උදව් කරන්නේ කෙසේද?

**රෙයිනා අයි. අබුර්තෝ,** *"With One Accord," 78-80*

ඔබගේ සනපූර්ණයේ සහ සහන සමිතියේ කොපමණ එකමුතුවකින් ඔබ ස්වාමින්වහන්සේගේ කාර්යයේ නිරත වනවාද කියා ඇගයීමක් කරගන්නට අබුර්තෝ සහෝදරියගේ පණිවිඩය ඔබට අවස්ථාවක් සපයා දෙයි. සාමාජිකයන්ට මෙය කිරීමට උපකාර කිරීමට, මොනාක් සමනලයින් ගැන, ගැලවුම්කරුවාණන් නෙපිවරුන් බැහැදැකපු ආකාරය (see Gospel Art Book, 82, 83, 84), සහ සභා මානුශීය ක්‍රියාකාරකම් පිලිබඳ පින්තූර පෙන්වන්නට පුළුවන්. පණිවිඩය පරික්ෂා කර බලා, එකමුතුව වැඩ කිරීමේ ආශිර්වාද සහ අරමුණු පිලිබඳ උදාහරණ යොදාගනිමින් අබුර්තෝ සහෝදරිය උගන්වන දේ අනාවරණය කරගන්නට සාමාජිකයන්ට පුළුවන්. "එකට එක්සත්ව" ක්‍රියාකරන්නට අපට කල හැක්කේ කුමක්ද?

**හෙන්රි බී. අයරින්,** *"His Spirit to Be with You," 86-89*

ශුද්ධාත්මයාණන්වහන්සේ ලබාගන්නට අපගේ උවමනාව සහ හැකියාව වර්ධනය

# අපගේ රැස්වීම් වල ක්‍රමය

**1.** පසුගිය පූජකවර හෝ සහන සමිති රැස්වීමෙන් ලද පෙළඹවීම් සහ ආරාධනා මත *ක්‍රියාකිරීමෙන් ලද අත්දැකීම් බෙදාගන්න* (සභාපතිත්ව සාමාජිකයෙකුගේ මගපෙන්වීම මත).

**2.** *එක්ව ඉගෙනගනිමු* (කැඳවීමක් ලද ගුරුවරයෙකු මෙහෙයවයි). සාමාජිකයන්ට ආරාධනා කිරීම පහත දේ සඳහා බොහෝවිට ප්‍රයෝජනවත් වේ:

අ.සම්මන්ත්‍රණ පණිවිඩ තුල යම්දෙයක් සොයන්න (ප්‍රශ්නයකට පිළිතුරක්, ප්‍රබෝධමත් වාක්‍ය ඛණ්ඩයක්, හෝ මූලධර්මයක උදාහරණයක් වැනි දෙයක්).

ආ.ඔවුන් සොයාගත් දේ ගැන සාකච්ඡා කරමින් බෙදාගන්න.

ඇ.එම පණිවිඩය ඔවුන්ගේ ජීවිත වලට සහ අත්දැකීම් වලට අදාල කරගතහැකි ආකාරය කෙසේදැයි සලකා බලන්න.

**3.** තනි තනිව හෝ කණ්ඩායම් *වශයෙන් ක්‍රියා කරන්නට සැලසුම් කරන්න* (සභාපතිත්ව සාමාජිකයෙකුගේ මගපෙන්වීම යටතේ).



කරන්නට, සභාපති අයරින් පෞද්ගලික අත්දැකීම් ගණනාවක් බෙදාගනී සහ නිශ්චිත මගපෙන්වීමක් ලබාදෙයි. ඔහුගේ අත්දැකීම් නැවත බැලීමෙන් අනතුරුව, ශුද්ධාත්මයාණන්වහන්සේ ඔවුන්ගේ හදවත් ස්පර්ශ කල හෝ සත්‍ය තහවුරු කල ඒ හා සමාන කුමන මතකයන් සනපූර්ණයේ සහ සහන සමිතියේ සාමාජිකයන්ට බෙදා ගන්නට හැකිද? “ශුද්ධාත්මයාණන්ගේ සේවාව ලබාගන්නට අපේ හදවත් විවෘත කරගැනීමට” උදව් වන ලෙස සභාපති අයරින් බෙදාගත් මගපෙන්වීම් බෝඩ් එකේ ලැයිස්තුගත කරන්නට සාමාජිකයන්ට පුළුවන්. ඔහුගේ මගපෙන්වීම් අනුගමනය කිරීම අපට අපගේ ජීවිතයේ සහ අපේ පවුල් තුල උපකාරී වන්නේ කෙසේද? අපේ සනපූර්ණයේ හෝ සහන සමිතියේ?

**ඩාලින් එච්. ඕක්ස්,** *“Small and Simple Things,” 89-92*

කුඩා සහ සරල දේවල් වලින් හොඳ සහ නපුර කෙරෙහි බලගතු බලපෑමක් ඇතිකරන බව ඉගැන්වීමට සභාපති ඕක්ස්ගේ පණිවිඩයේ උපමා ඇතුලත් වෙයි. මෙම උපමා වලට ගස් මුල්, හබල් ගාන කණ්ඩායමක්, කඹයක තන්තු සහ කාන්දු වන ජලය ඇතුලත් වෙයි. මෙම උපමා කියවා කුඩා හා සරල දේවල් බලය පිලිබඳ ඒවා නොනවත්වා උගන්වන දේ සාකච්ඡා කරන්නට සාමාජිකයන්ට පුළුවන්. ශුද්ධාත්මයාණන්වහන්සේගේ මගපෙන්වීම අපේ ජීවිතයට ලඟාකරන කුඩා හා සරල දේවල් මොනවාද? සභාපති ඕක්ස්ගේ උපදෙස පිළිපදින්නට කරන්නට ඔවුන්ට පෙළඹවීමක් ලැබුණු දේ ගැන මෙනෙහි කරන්නට සාමාජිකයන්ට ආරාධනා කරන්න.

**රසල් එම්. නෙල්සන්,** *“Revelation for the Church, Revelation for Our Lives,” 93-96*

ඔහුගේ පණිවිඩයේ, “ආත්මික එළිදරව් ලබාගැනීමට අපේ ආත්මීය හැකියාව” වර්ධනය කරගන්නා ලෙස සභාපති නෙල්සන් ආ සමග බැගෑපත් වුයේය. ඔහුගේ උපදෙස් අනුගමනය කරන්නට සාමාජිකයන්ට උපකාර වීම පිණිස, පහත සඳහන් ආකාරයේ ප්‍රශ්ණ බෝඩ් එකේ සටහන් කරන්නට ඔබට පුළුවන්: අපට එළිදරව් උවමනා වන්නේ ඇයි? එළිදරව් ලබාගැනීමට තනි තනිව හා එක්ව උපදේශ ලබා ගැනීමේදී, අපගේ ධාරිතාව අපි වැඩි කරගන්නේ කොහොමද? අපි එළිදරව් සෙවීමේදී සභාපති නෙල්සන් පොරොන්දු වූ අපට ලැබෙන ආශිර්වාද මොනවාද? සාමාජිකයන්ව කණ්ඩායම් වලට බෙදන්න, එම ප්‍රශ්ණ වලට පිළිතුරු සොයන්නට එම එක් එක් කණ්ඩායමට ආරාධනා කරන්න.

**ජෙරිට් ඩබ්. ගොන්ග්,** *“Christ the Lord Is Risen Today,” 97-98*

සනපූර්ණයේ සහ සහන සමිතියේ සාමාජිකයන්ට අපගේ ගිවිසුම් හා යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වන්දිගෙවීම ගැන වැඩිහිටි ගොන්ග්ගේ පණිවිඩයෙන් ඉගෙනගත හැක්කේ මොනවාද? ගැලවුම්කරුවාණන්ගේ වන්දිගෙවීම සහ අපේ ගිවිසුම් සමග එක්ව ක්‍රියා කිරීමේදී - අපට පිරිනමන - ආශිර්වාද සොයමින්, පණිවිඩය පරික්ෂා කරන්නට සාමාජිකයන්ට ආරාධනා කරන්නට ඔබට පුළුවන්. ඉන්පසු ඔවුන් සොයාගත් දේ ගැන පහත සඳහන් ආකාරයට ප්‍රශ්ණ ඇසීම ගැන සලකා බලන්න: අපට “ශක්තිය දෙන්නට සහ උතුම් බවට පත් කරන්නට” අපේ ගිවිසුම් සහ වන්දිගෙවීම එක්ව ක්‍රියා කරන්නේ කොහොමද? ඒවා අපට කුමක් රඳවා තබා ගන්නට සහ අත්හැර දමන්නට උදව් කරනවාද?

**උලිසස් සෝරෙස්,** *“Prophets Speak by the Power of the Holy Spirit,” 98-99*

ස්වාමින්වහන්සේගේ කැමැත්ත අපි ඉටුකරනවා මදි යැයි අපිට සිතුනු විට ඇදහිල්ලෙන් යුතුව ක්‍රියා කරන්නට වැඩිහිටි සෝරෙස්ගේ පණිවිඩය අපව දිරිමත් කරයි. ප්‍රේරිතවරයෙකු ලෙස නව කැඳවීමක් ලැබීමේදී වැඩිහිටි සෝරෙස් සැනසුමක් සහ අස්වසුමක් ලබාගත්තේ කෙසේද? ධර්මදූත සභාපතිවරයෙකු ලෙස කැඳවීමක් ලැබීමේ අත්දැකීමෙන් ඔහු ඉගෙනගත්තේ කුමක්ද? ඔහුගේ අත්දැකීමෙන් අපට ඉගෙනගත හැක්කේ කුමක්ද? ඔවුන් කරනවාට කැමැත්තෙන් ස්වාමීන්වහන්සේ විසින් ඔවුන්ට දුන් යම් දෙයක් ගැන අවිනිශ්චිත බවක් දැනුනු අත්දැකීමක් බෙදාගන්නට සාමාජිකයන්ට කාලය ලබාදෙන්න. ඉදිරියට ගමන් කරන්නට ඇදහිල්ල සොයාගන්නට ඔවුන් කලේ කුමක්ද?

**ජෙෆ්රි ආර්. හොලන්ඩ්,** *‘Be With and Strengthen Them,” 101-3*

සනපූර්ණ සහ සහන සමිති සාමාජිකයන් වශයෙන් “පූජකවර සහ සහන සමිති දේව සේවා සංකල්පයේ” සිදුවූ වෙනස්කම් පිලිබඳ ඉගෙන ගැනීමේදී ඔවුන්ට ඇති ප්‍රශ්ණ මොනවාද? වැඩිහිටි හොලන්ඩ්ගේ පණිවිඩය යම් විට පිළිතුරු සපයයි. මෙම වෙනස්කම් වල අත්තිවාරම වූ වැඩිහිටි හොලන්ඩ් උගන්වන ශුභාරංචි මූලධර්ම පිලිබඳ බැලීමට සාමාජිකයන්ට පුළුවන්. ඔහුගේ පණිවිඩයේ අපි සොයාගන්නා ආරාධනාවන් මොනවාද? පොරොන්දු වූ ආශිර්වාද මොනවාද? අපට “ක්‍රිස්තුස්වහන්සේගේ සත්‍ය අනුගාමිකයන්” වීමට දේව සේවය කිරීමේ මෙම නව ආකාර උදව් වෙන්නේ කෙසේද?

**ජීන් බී. බින්ග්හම්,** *"Ministering as the Savior Does," 104-7*

අයගේ පණිවිඩයේ, අපගේ දේව සේවා ප්‍රයත්නයන්ට මගපෙන්විය හැකි ආකාරයේ ප්‍රශ්ණ අපගෙන්ම අසාගන්නට බින්ග්හම් සහෝදරිය අපට ආරාධනා කළාය. ඔවුන්ගේ ප්‍රයත්නයන්ට මෙම ප්‍රශ්න මගපෙන්වන්නේ කෙසේද යන්න සාමාජිකයන්ට සාකච්ඡා කරන්නට පුළුවන් සහ ඉන්පසු බින්ග්හම් සහෝදරියගේ ප්‍රශ්ණ වලට පිළිතුරු සොයන්නට පුළුවන්, "ඉතින් [දේව සේවය] මොනවගේද?" පුද්ගලයන්ට දේව සේවය කිරම ගැන බින්ග්හම් සහෝදරිය බෙදාගත් උදාහරණ නැවත නැවත බැලීමට ඔබට කාලය වය කරන්නට පුළුවන් සහ ඔවුන්ගේම අත්දැකීම් බෙදාගන්නට සාමාජිකයන්ට ආරාධනා කරන්න. අපි දේව සේවය කල යුත්තේ ඇයි සහ කෙසේද යන්න තේරුම්ගැනීම වර්ධනය කරන කුමන දේවල් අපි බින්ග්හම් සහෝදරියගේ පණිවිඩයෙන් සොයාගන්නවාද?

**ඩියේටර් එෆ්. උච්ඩ්රොෆ්,** *"Behold the Man!," 107-10*

ලෝක ඉතිහාසයේ වඩාත්ම වැදගත් අවස්ථා වන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වන්දිගේවීමේ පරිත්‍යාගය සහ නැවත නැගිටීම බව තවත් කෙනෙකුට තේරුම් ගන්නට අපි උදව් කරන්නේ කොහොමද? වැඩිහිටි උච්ඩ්රොෆ්ගේ පණිවිඩයේ කොටස් කියවන අතරතුර මේ ගැන මෙනෙහි කරන්නට සාමාජිකයන්ට ආරාධනා කරන්න. මෙම අවස්ථා ඔවුන්ට ඉතා වැදගත් බව පැහැදිලි කරන්නට උදව් වෙන කුම දේවල් ඔවුන් සොයාගෙන තිබේද? මෙම සාකච්ඡාවෙන් පසු, "එම මිනිසා දෙස බලන්න" යන්නෙන් ඔවුන්ට අදහස් වන්නේ කුමක්ද යන්න පන්තියේ සාමාජිකයන් සමග කතා කරන්න. "එම මිනිසා දෙස බලන්නට" අප ඉගෙනගෙන ඇත්තේ කොහොමද?

**ක්වින්ටින් එල්. කුක්,** *"Prepare to Meet God," 114-17*

කර්ට්ලන්ඩ් දේවමාලිගාවේ නැවත පිහිටවූ පූජකවර යතුරු පිලිබඳ වැඩිහිටි කුක්ගේ පණිවිඩය සාරාංශ කරන ලෙස සාමාජිකයන්ට ආරාධනා කරමින් මෙම සාකච්ඡාව ආරම්භ කරන්නට ඔබට පුළුවන්. වැඩිහිටි කුක්ගේ පණිවිඩයට අනුව, මෙම යතුරු වලට අදාලව සභාවට ඇති වගකීම් මොනවාද? මෙම වගකීම් අද සභාව විද්‍යාමාන කරන්නේ කොහොමද? බෝඩ් එක මත මෙම වචන ලියන්න, ධර්මිෂ්ටබව, එකමුතුකම සහ සමානාත්මතාවය, ඉන්පසු මෙම මූලධර්ම පිලිබඳ වැඩිහිටි කුක්ගේ පණිවිඩයෙන් ඉගෙනගත් තේරුම්ගත් දේ බෙදාගන්නට සාමාජිකයන්ගෙන් ඉල්ලා සිටින්න. සභාවේ ශුද්ධවූ වගකීම් සම්පූර්ණ කරන්නට මෙම මූලධර්ම අපට උදව් වන්නේ කොහොමද?



# හතරවන - ඉරුදින

## රැස්වීම්

සෑම මාසයකම හතරවන ඉරුදින, වැඩිහිටි සනපූර්ණය සහ සහන සමිතිය පළමු සභාපතිත්වය සහ ප්‍රේරිතවරු දොළොස්දෙනාගේ සනපූර්ණය විසින් තෝරාගත් මාතෘකාවක් පිලිබඳ සාකච්ඡා කරනු ලබයි. හතරවන ඉරුදින මාතෘකාව සෑම ප්‍රධාන සම්මන්ත්‍රණයකටම පසු නවීකරණය වෙයි. දැන් සිට මීළඟ ප්‍රධාන සම්මන්ත්‍රණය දක්වා, මාතෘකාව බවට පත්වන්නේ "අන් අයට දේව සේවය කිරීමයි." සෑම මසකම, දේව සේවයට අදාල පහත සඳහන් ඕනෑම මූලධර්මයක් මත සාකච්ඡා මෙහෙයවීමට නායකයන් හෝ ගුරුවරුන් තෝරාගනී.

දේව සේවය පිලිබඳ සාකච්ඡා වලට අමතර උපකාරක සඳහා, අනාගත ලියහෝනා සඟරා වල "දේව සේවා මූලධර්ම" *බලන්න.*

**දේව සේවය කිරීම යනු කුමක්ද?**

ඔබගේ කොට්ටාශයේ හෝ ශාකාවේ සාමාජිකයන්ට දේව සේවය යන්නේ තේරුම කුමක්ද? සොයාගැනීමට නම්, දේව සේවය යනුවෙන් බෝඩ් එකේ ලියන්න, ඉන්පසු දේව සේවය හා සම්බන්ධ වන අනෙකුත් වචන ඒ වටා ලිවීමට සාමාජිකයන්ට ආරාධනා කරන්න. පහත සඳහන් ශුද්ධලියවිලි භාවිතා කරමින් ලැයිස්තුවට එකතු කරන්නට වචන හෝ වාක්‍ය සොයාගන්නට සාමාජිකයන්ට පුළුවන්: මතෙව් 25:34-40; ලූක් 10:25-37; 2 නෙපි 25:26; මොසායා 18:8-9; 3 නෙපි 18:25; සහ දහම සහ ගිවිසුම 81:5. දේව සේවය පිලිබඳ මෙම පද තුලින් අපි ඉගෙනගන්නේ කුමක්ද? දේව සේවය පිලිබඳ ඔවුන් දැක ඇති අත්දැකීම් බෙදාගන්නට සාමාජිකයන්ට ආරාධනා කරන්නට ඔබට පුළුවන්. මිනිසුන්ගේ ආත්මික හා ලෞකික අවශ්‍යතා ඉටුකරගන්නට අපේ දේව සේවය උපකාරී වන්නේ කෙසේද? මිනිසුන්ට ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි තවත් ලංවෙන්නට එය උපකාරී වන්නේ කෙසේද?

**ගැලවුම්කරුවාණන්වහන්සේ දේව සේවයට අපට ඇති සර්ව සම්පූර්ණ උදාහරණයයි.**

දේව සේවය ගැන ඵලදායී ලෙස ඉගෙන ගැනීමට නම්, ගැලවුම්කරුවාණන් අන් අයට සේවය කල ආකාරය ගැන ශුද්ධලියවිලි කතන්දර

සාමාජිකයන් බෙදාගත යුතුය - යොහාන් 4-6 දක්වා සහ මාර්ක් 1:1-12 දක්වා උදාහරණ කිපයක් සොයාගත හැකිය. මෙම කතන්දර වලින් ඔවුන්ගේ සිත්ගත්තේ මොනවාද සහ දේව සේවය ගැන ඔවුන් ඉගෙනගත් මූලධර්ම මොනවාද යන්න සාමාජිකයන්ට බෙදාගන්නට පුළුවන්. උදාහරණයක් ලෙස, ගැලවුම්කරුවාණන් අන් අය කෙරෙහි තම සේවය පෞද්ගලිකරණය කලේ කෙසේද? උන්වහන්සේ මිනිසුන්ගේ ආත්මික මෙන්ම ලෞකික අවශ්‍යතා වලට සහය ලබාදුන්නේ කෙසේද? මිනිසුන් මෙම මූලධර්ම දේව සේවයේ යොදාගැනීම ඔවුන් දැක ඇති අවස්ථා පන්ති සාමාජිකයන්ට බෙදාගත හැකිය.

**දේව සේවය ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයෙන් පෙලඹවී ඇත.**

දේව සේවය ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයෙන් පෙලඹවීම ගවේෂණය කරන්නට, පහත සඳහන් වාක්‍ය බෝඩ් එකේලියා හිස්තැන් පුරවා අදහස් යෝජනා කරන්නට සාමාජිකයන්ට ආරාධනා කරන්නට ඔබට පුළුවන්: මම සේවය කරන මිනිසුන්ම මම අවංකව ප්‍රේම කරන විට, මම________. අනෙකුත් හේතූන් සඳහා මම සේවය කරන විට, මම ________. අන් අය සඳහා අපේ දේව සේවය ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය තුලින් පෙලඹවී ඇති බව අපි සහතික කරගන්නට කුමක් කල යුතුද? දේව සේවය කිරීමට අපට පැවරී ඇති අනිත් අය කෙරෙහි ක්‍රිස්තුස්වහන්සේගේ වැනි ප්‍රේමයක් අපි ගොඩනගා ගන්නේ කෙසේද? (මොරෝනි 7:45 බලන්න). සමහරවිට ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය මත දේව සේවය කල උදාහරණ බෙදාගන්නට සාමාජිකයන්ට පුළුවන්.

**උන්වහන්සේගේ සියලුම දරුවන් බලාගැනීමට සහ සලකා බැලීම දෙවියන්වහන්සේට උවමනායි.**

සභාපති රසල් එම්. නෙල්සන් මෙසේ කීවේය, "ස්වාමින්වහන්සේගේ ජීවමාන සභාවේ හැමවිටම කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ, දෙවියන්වහන්සේගේ එක් එක් දරුවන්ටත් සහ ඔවුන්ගේ පවුල් වලට දේව සේවය සැපයීමට සංවිධානය කල, මෙහෙයවනු ලැබූ ප්‍රයත්නයන්ය" ("දෙවියන්වහන්සේගේ බලය සහ අධිකාරිය සමග දේව සේවය කිරීම," ලියහෝනා, මැයි 2018, 69.). එක් එක් පුද්ගලයන් ගැන වඩාත් හොඳින් සොයාබලන්නට සභාව අපට උදව් කරනවා යයි සභාපති නෙල්සන් අපට උගන්වන "සංවිධානය වූ, මෙහෙයවූ" ආකාර සමහරක් මොනවාද? මෙම ප්‍රයත්න ස්වාමින්වහන්සේගේ සත්‍ය සහ ජීවමාන සභාවේ "කැපී පෙනෙන" ප්‍රයත්න බවට පත්වන්නේ ඇයි? (අදහස් සමහරක් සඳහා මොරෝනි 18:21-22 බලන්න සහ මොරෝනි 6:4-6 බලන්න). මිනිසුන් තම සභා කැඳවීම් හෝ පැවරුම් වල දේව සේවය කිරීමෙන් ඔවුන්ගේ ජීවිත වලට හෝ අන් අයගේ ජීවිත වලට ලැබී ඇති ආශිර්වාද මොනවාද?

**ප්‍රාණයන්ගේ වටිනාකම දෙවියන්වහන්සේගේ පෙනීම ඉදිරියේ අති විශාලය.**

මොසයාගේ පුතුන්ගේ අත්දැකීම අපි අන් අයට කරන දේව සේවය මිනිසුන් කෙරෙහි බලපාන්නේ කෙසේද යන්න පැහැදිලි කරයි. 'නෙපිවරු ලැමනයිට්වරුන්ව දුටු ආකාරය' සහ 'මොසයාගේ පුතුන් ලැමනයිට්වරුන්ව දුටු ආකාරය' ලෙස බෝඩ් එකේ සටහන් කරන්න. ඉන්පසු මොසායා 28:1-3 සහ ඇල්මා 26:23-26 දක්වා කියවා එම එක් එක් ප්‍රකාශය පහලින් ලිවීමට සුදුසු වචන හා වාක්‍ය සොයාගන්නට සාමාජිකයන්ට ආරාධනා කරන්න. අපි මිනිසුන් දෙස බලන ආකාරය අපි ඔවුන්ට දේව සේවය කරන ආකාරයට බලපාන බවට මෙම සංසන්දනය කිරීම අපට උගන්වන්නේ කුමක්ද? දෙවියන්වහන්සේ දකින ආකාරයට මිනිසුන් දෙස බැලීමට අප ඉගෙනගන්නේ කෙසේද? (දහම සහ ගිවිසුම 18:10-16 බලන්න).

**සත්‍ය දේව සේවය අන් අයගේ අවශ්‍යතාවයන් මත අවධානය ලබාදෙයි.**

අප දේව සේවයේ යෙදෙන විටදී අන් අයගේ අවශ්‍යතා කෙරෙහි අවධානය දීමේ ඇති වැදගත්කම සාමාජිකයන්ට තේරුම් කිරීම පිණිස, දේව සේවය ත්‍යාග ලබාගැනීම සහ ලබාදීම ලෙස සංසන්දනය කරන්නට පුළුවන්. අපට අවශ්‍ය හා උවමනා දේ පැහැදිලිව දැනසිටි අයෙක්ගෙන් අපි කෙදිනක හෝ අර්තාන්විත ත්‍යාගයක් ලබා ඇත්ද? අන් අයගේ අවශ්‍යතා වලට අනුකූලව මිනිසුන් දේව සේවය කරන ආකාරය පැහැදිලි කරන මෑත කාලීන ප්‍රධාන සම්මන්ත්‍රණ කතන්දර පිලිබඳ සාකච්ඡා කිරීම සලකා බලන්න. (උදාහරණයක් ලෙස, ජීන් බී. බින්ග්හම්, "ගැලවුම්කරුවාණන්ගේ ආකාරයට දේව සේවය කිරීම," ලියහෝනා, මයි 2018 බලන්න). මෙමෙ මූලධර්මය පැහැදිලි කරන අනෙකුත් කතාන්දරද සාමාජිකයන්ට බෙදාගන්නට පුළුවන්.

අන් අයගේ අවශ්‍යතා මොනවාද යන්න අපි ඉගෙනගන්නේ කොහොමද? ඔවුන් දේව සේවය කරන මිනිසුන්ගේ ලයුස්තුවක් සාදන ලෙස එක් එක් සාමාජිකයාට ආරාධනා කරන්න. "ක්‍රිස්තුස්වහන්සේට තවත් ලංවෙන්නට මෙම පුද්ගලයාට අවශ්‍ය මොනවාද?" යන ප්‍රශ්ණයට පිළිතුර එක් එක් නම ඉදිරියෙන් ලියන්න. සුදුසු පරිදි, එක් එක් පුද්ගලයාට ලැබීමට අවශ්‍ය වත්පිළිවෙත් එයට එකතු කරන ලෙස සාමාජිකයන් දිරිගන්වන්න. මෙම ප්‍රශ්නය ගැන සිතාබලා සහ අන් අයගේ අවශ්‍යතා ඉටුකිරීමට ඔවුන්ට උදව් විය හැකි ආකාර සඳහා පෙළඹවීම් නොකඩවාම සොයන්නට සාමාජිකයන්ට ආරාධනා කරන්න.

**අන් ය තුලින් ලැබෙන දේව සේවය අපි පිළිගනිම ස්වාමින්වහන්සේට අවශ්‍යයි.**

වැඩිහිටි රොබර්ට් ඩී. හේල්ස් මෙසේ කීවේය: "ශුභාරංචි සැලසුම ලබාගැනීම සහ ලබාදීම බලාපොරොත්තු වෙයි.... අමාරුකම් වල සිටින පුද්ගලයන් නිරතුරුව මෙසේ කියයි: "මම එය තනියම කරන්නම්,'... 'මට මම ගැන බලාගන්න පුළුවන්.' තවත් අයෙකුගේ උපකාරයක් අවශ්‍ය නොවන්නට තරම් කිසිදු මනුෂ්‍යයෙක් බොහෝ පෝසත් නැත, අසල්වැසියාට ප්‍රයෝජනයක් නොවන්නට තරම් කිසිදු කෙනෙක් බොහෝ දුප්පත් නැත. ආත්මවිශ්වාසයෙන් තව කෙනෙකුගෙන් සහය පැතීමේ සහ කරුණාවෙන් යුතුය එය ලබාගැනීමට ඇති ස්වභාවය, අපේ විදියේ ස්වභාවික කොටසක්" ("We Can't Do It Alone," *Ensign,* Nov. 1975, 91, 93). අන් අයගේ උපකාර ලබාගැනීමට අපි සමහර අවස්ථාවලදී පසුබට වන්නේ ඇයි? උපකාර ලබාගැනීමට ඇති කැමැත්තෙන් අපි අපට සේවය කරන අයට ආශිර්වාද ලබන්නට උදව් වන්නේ කෙසේද? අන් අයගේ දේව සේවය ලබාගැනීමට ඔවුන් වඩා හොඳින් විවෘත විය යුත්තේ කෙසේද යන්න මෙනෙහි කිරීමට සාමාජිකයන්ට මිනිත්තු කිහිපයක් ලබාදෙන්න. 1 කොරින්ති 12:13-21 දක්වා අප එකිනෙකාට කල යුතු යැයි යෝජනා කරන්නේ කුමක්ද?

**අන් අයට දේව සේවය කල හැකි ආකාර ගණනාවක් ඇත.**

අප එකිනෙකාට දේව සේවය කල හැකි ආකාර ගණනාවක් ගැන සාමාජිකයන්ට සිතාබලන්නට උදව්වක් ලෙස, වැඩිහිටි ජෙෆ්රි ආර්. හොලන්ඩ්ගේ පණිවිඩය නැවත කියවීමට ඔවුන්ට ආරාධනා කරන්නට ඔබට පුළුවන් "ඔවුන් සමග හිඳ ඔවින්ව ශක්තිමත් කරන්න" (ලියහෝනා, මැයි 2018, 101-3; මුද්‍රණය වීමට නියමිත ලියහෝනා සඟරාවේ "දේව සේවයේ මූලධර්ම" ද බලන්න). සාමාජිකයන්ව කුඩා කණ්ඩායම් වලට බෙදන්න, සිදුවීම් කිහිපයකදී පුද්ගලයෙකුට අවශ්‍ය උදව්ව එක් එක් කණ්ඩායමට සිතන්නට පුළුවන්. එම සිදුවීම් හරහා ඔවුන්ගේ ආත්මීය හා භෞතික අවශ්‍යතා වලට එම මිනිසුන්ට දේව සේවය ලබාදීමට හැකි ආකාර ගණනාවක් මතක් කිරීමට ඔවුන්ට පුළුවන්. ඔවුන්ගේ අදහස් බෙදාගැනීමට කණ්ඩායම් වලට ආරාධනා කර ඔවුන් දේව සේවය කරන මිනිසුන්ට එය ආශිර්වාදයක් වේ දැයි මෙනෙහි කරන්නට ඔවුන්ගෙන් විමසන්න. ■

© 2018 by Intellectual Reserve, Inc. සියලුම හිමිකම් ඇවිරිණි. ඉංග්‍රීසි අනුමැතිය: 3/18. පරිවර්තන අනුමැතිය: 3/18. එන්න, මා අනුගමනය කරන්න - වැඩිහිටි සනපූර්ණය සහ සහන සමිතිය සඳහා, 2018 මැයි. Sinhala. PD60006160 408

